ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE



| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.10. 9. |

# ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 12-2015

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

## <u>රාජ්‍ය වියදම් කළමනාකරණය - දින දර්ශන සහ දිනපොත් මුද්‍රණය</u>

උක්ත කරුණ සම්බන්ධව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2015.10.02 දිනැති අංක NBD/AO/1/1/2015/04 දරන අයවැය චක්‍රලේඛ ලිපිය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

02. එමගින් මහජනතාවට, සේවකයින්ට සහ සේවය ලබා ගන්නා වෙනත් පාර්ශවයන් වෙත නොමිළයේ බෙදා හැරීමට මුද්‍රණය කරනු ලබන දින දර්ශන සහ දින පොත් සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයට අයත් සමාගම් ද ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන වාර්ෂිකව රජයේ මුදල් විශාල ප්‍රමාණයක් වැය කරන බව නිරීක්ෂණය වී ඇති බව සඳහන් කර ඇත.

03. එමෙන්ම මෙම අයිතමයන් මුද්‍රණය කිරීමෙන් රාජ්‍ය වියදම සඳහා ඇති කර තිබෙන බලපෑමද සැළකිල්ලට ගෙන, ඒකාබද්ධ අරමුදල් භාවිතා කරමින් දින දර්ශන හා දින පොත් මුද්‍රණය කිරීම 2016 වර්ෂයේ සිට නතර කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති බව වැඩිදුරටත් සඳහන් වේ.

04. ඒ අනුව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට නොමිළයේ බෙදා හැරීම සඳහා දින දර්ශන හා දින පොත් මුද්‍රණය කිරීමෙන් වැළකී සිටින ලෙස කාරුණිකව දන්වමි.

05. එහෙත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ආයතන වල ප්‍රයෝජනය සඳහා මුද්‍රණය කරනු ලබන දින දර්ශන හා දින පොත් මුද්‍රණය කිරීමේ වාර්ෂික වැඩ සටහන් සඳහා මෙම උපදෙස් අදාළ නොවන බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

06. මෙම උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක සියලු ආයතන දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි.

එස්.එම්.පී.කේ.පෙරේරා
ප්‍රධාන ලේකම්(වැ.බ),
දකුණු පළාත.

පිටපත් : 01. භාණ්ඩාගාර ලේකම්,මහා භාණ්ඩාගාරය,කොළඹ : දැ.ගැ.ස.
02. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) : අ.ක.ස.
04. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) : අ.ක.ස.
05. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.